## 2025-09-03 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

### 01. පාසල්වල 5 සහ 6 ශ්‍රේණි හැර 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම

යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා පන්ති කාමරයක සිටින ශිෂ්‍ය සංඛ්‍යාව අනුමත සීමා තුළ පමණක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, අධ්‍යාපනය සඳහා රටේ සියලුම දරුවන්ට පවතින අයිතිය තහවුරු කරමින් පාසල්වල 5 සහ 6 වන ශ්‍රේණි හැර අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමට අවස්ථාව ලබා දීම සඳහා නිසි ක්‍රමවේදයක් හඳුන්වා දීම සුදුසු බව හඳුනා ගනු ලැබ ඇත. එකී කරුණු සැලකිල්ලට ගනිමින්, අතරමැදි ශ්‍රේණිවලදී විවිධ හේතූන් මත දැනට ඉගෙනුම ලබන පාසලේ සිට වෙනත් පාසලකට ඇතුළත් වීමට සත්‍ය වශයෙන්ම අවශ්‍ය සිසුන් සඳහා ප්‍රමුඛතාව ලැබෙන පරිදි පාසල් අයදුම් කිරීමේ අවස්ථාව සලසා දීම පිණිස නව චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාව විසින් පත් කරන ලද අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ද සැලකිල්ලට ගනිමින්, පාසල්වල 5 සහ 6 වන ශ්‍රේණි හැර 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමට අදාළ ව මේ දක්වා නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් අවලංගු කර ඒ සඳහා නව චක්‍රලේඛ උපදෙස් නිකුත් කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

### 02. ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායයන් වසා දැමීම

මහජන සේවා සැපයීම සහ උපායමාර්ගික ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම වැනි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කලකට පෙර පිහිටුවන ලද ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන් ඒවා පිහිටුවීමේ අරමුණු වර්තමානය සමඟ නොගැළපීම සහ වෙළෙඳපොළ අවශ්‍යතා සමඟ නොගැළපීම යන හේතූන් මත තවදුරටත් පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවීම සහ ඌන මූල්‍ය කාර්යසාධනය ආදී හේතු නිසා අක්‍රිය තත්ත්වයට පත් ව තිබේ. ජාතික ආර්ථිකයට හෝ රාජ්‍ය සේවා සැපයීමට අර්ථවත් දායකත්වයක් ලබා නොදෙන ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය සංස්ථා හා රජය සතු සමාගම් වැනි විවිධ කාණ්ඩයන්ට අයත් රාජ්‍ය ව්‍යවසායයන් රජයට වැය බරක් වන පරිදි තවදුරටත් පවත්වාගෙන යාම වෙනුවට, එම ආයතන ඇවර කර වසා දැමීම යෝග්‍ය බවට හඳුනාගනු ලැබ ඇත. ඒ අනුව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික



163, කිරුලපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති යෝජනාව සැලකිල්ලට ගෙන, එම අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කරනු ලබන විශේෂ ඇවර කිරීමේ ඒකකයක අධීක්ෂණය යටතේ දැනට ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායයන් 33ක් අදියර 02ක් යටතේ විධිමත් ලෙස ඇවර කර වසා දැමීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 03. ඇන්ටිගුවා සහ බාබියුඩා සමඟ රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කිරීම

ලතින් ඇමෙරිකානු සහ කැරිබියන් කලාපයේ රටවල් 13ක් සමඟ විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම පිණිස මීට පෙර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, ඇන්ටිගුවා සහ බාබියුඩා හැර එම කලාපයේ අනෙකුත් රටවල් සමඟ ශ්‍රී ලංකා රජය දැනටමත් විධිමත් රාජ්‍යතාන්ත්‍රික සබඳතා ස්ථාපිත කිරීම පිණිස මේ වන විට අවශ්‍ය පියවර ගනු ලැබ තිබේ. දෙරටට ම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ අත් කර ගැනීමේ සහ දෙරටේ දේශපාලන, සමාජ-ආර්ථික සහ සංස්කෘතික ක්ෂේත්‍රවල පවතින මිත්‍ර සබඳතා සහ සහයෝගිතාව වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා රජය හා ඇන්ටිගුවා සහ බාබියුඩා රජය අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතා ආරම්භ කිරීම පිළිබඳ ගිවිසුමට අත්සන් තැබීම පිණිස විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. කෙරවලපිටිය රේගු සතොයක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීම

කෙරවලපිටියේ රේගු සතොයක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවට අයත් ඉඩම් කොටසක් ශ්‍රී ලංකා රේගුව වෙත පවරා දීම පිණිස 2025-03-17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇති අතර, එම රේගු සතොයක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වන ක්‍රමවේදය තීරණය කිරීම පිණිස කමිටුවක් පත් කර ඇත. එම කමිටුව විසින් වඩාත් ශක්‍යතාවකින් යුත් ව්‍යාපාරික ආකෘතියක් තෝරා ගැනීම පිණිස යෝග්‍ය නිර්ණායක සහිත ව සිය නිර්දේශ ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, එකී කමිටුවේ නිර්දේශය මත පදනම්ව, යෝජිත කෙරවලපිටිය රේගු සතොයක්ෂණ මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය දෙමුහුන් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව ආකෘතියක් යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු පෞද්ගලික හවුල්කරුවකු තෝරා ගැනීම සඳහා අභිලාෂ කැඳවීමේ ඉල්ලීම් සහ යෝජනා සඳහා වන ඉල්ලීම් කැඳවීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 05. සේනානායක සමුද්‍රයේ සොරොව් කුලුන, සොරොව් බැරලය හා අවශේෂී කොටස් නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතිය

1953-08-28 දින ජනතා අයිතියට පත් කරනු ලැබ ඇති සේනානායක සමුද්‍රය කුඹුරු අක්කර 120,000ක පමණ ප්‍රදේශයකට වාරි ජලය සපයනු ලබන අතර, මෙගාවොට් 20ක ධාරිතාවයක විදුලිය ජාතික පද්ධතියට එක් කිරීමට දායක වේ. 1992 වසරේදී එහි ප්‍රධාන බැම්ම හා සම්බන්ධ සොරොව් කුලුනෙහි හා සොරොව් බැරලයෙහි සහ ප්‍රධාන බැම්මෙන් පිටත ඉදි කර ඇති පිටවාන නිර්මිතයෙහි පැලීම් ඇති වීම මුල් වරට නිරීක්ෂණය කර ඇත. කාලයත් සමඟ එම පැලීම් විශාල වෙමින් හා පැතිරෙමින් තිබේ. මේ සඳහා ස්ථිර විසඳුමක් ලබා දීම පිණිස අදාළ නිර්මිත නැවත ඉදි කළ යුතු බව හඳුනාගෙන ඇති නමුත්, ඉදිකිරීම් සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වීම, වසර 02ක පමණ කාලයක් ජලාශය හිස් කර තැබීමට සිදු වීම හේතුවෙන් විශාල වගා භූමි ප්‍රමාණයකට වාරි ජලය සැපයීමට නොහැකි වීම මඟින් රටේ විශාල සහල් හිඟයක් ඇති වීමට අවකාශ ඇති වීම සහ ප්‍රමාණවත් තාක්ෂණික හැකියාවක් නොමැති වීම වැනි කරුණු මත නව සොරොව් නිර්මිතයක් ඉදි කිරීම මේ දක්වා කළ නොහැකි වී ඇත. පවතින අවදානම සහ ආපදාවකදී සිදු විය හැකි හානිය අඩු කර ගැනීම පිණිස 2025 යල කන්නයට ජලය නිකුත් කිරීමෙන් පසු ජලාශයේ මුළු ධාරිතාව 40%කට ආසන්න ප්‍රමාණයක පවත්වා ගනිමින් යෝජිත ඉදිකිරීම සිදු කිරීම සඳහා සැලසුම් කර තිබේ. ඒ අනුව, ලෝකයේ දැනට පවතින නවීනතම තාක්ෂණික දැනුම ලබා ගැනීමට හැකි වන පරිදි, ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා අදාළ ඉදිකිරීම් සඳහා සුදුසු කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම පිණිස කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 06. සැහැල්លු මැදිරි තුනකින් යුත් දුම්රිය කට්ටලයක් දේශීයව එකලස් කිරීම

දැනට භාවිතයේ පවතින දුම්රිය වැඩි ප්‍රමාණයක් නාගරික ප්‍රදේශවල මගී ප්‍රවාහන කටයුතු සඳහා යොදවා ඇති අතර, ග්‍රාමීය ප්‍රජාවගේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීම සඳහා රේල් බස් කිහිපයක් පමණක් දැනට ධාවනයේ යොදවා ඇත. එහෙත්, පවතින දුම්රිය කාලසටහනට අනුව රේල් බස් ධාවනය කිරීමේදී ප්‍රායෝගික ගැටලු මතු වී තිබේ. එමෙන්ම, ප්‍රමාණවත් මගීන් සංඛ්‍යාවක් නොමැති වීම හේතුවෙන් නාගරික ප්‍රදේශවල ධාවනයට යොදා ගන්නා දුම්රිය කට්ටල ග්‍රාමීය ප්‍රදේශ සඳහා යෙදවීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව ද හඳුනාගෙන ඇත. එබැවින්, ග්‍රාමීය මට්ටමින් ධාවනය කළ හැකි, මැදිරිවලට සවි කරන ලද ඩීසල් එන්ජිමකින් බලගැන්වෙන විද්‍යුත් පාලන පද්ධතියක් සහ අනෙකුත් නවීන පහසුකම් සහිත, දුම්රිය මැදිරි 03කින් සමන්විත සැහැල්ලු දුම්රිය කට්ටල පුත්තලම, මඩකලපුව සහ මිහින්තලේ වැනි ප්‍රදේශවල දුම්රිය මාර්ග සඳහා හඳුන්වා දීමට සැලසුම් කර තිබේ.

ඒ අනුව, ග්‍රාමීය ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාව සලසාලීමට හැකි වන පරිදි මගීන් 200-240ක පමණ ධාරිතාවක් සහ ප්‍රමාණවත් භාණ්ඩ ප්‍රවාහන ඉඩකඩක් සහිත මැදිරි 03කින් යුතු දුම්රිය කට්ටලයක් දේශීයව එකලස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන අස්වනු ආරක්ෂා කර ගැනීම සඳහා තෝරා ගත් නිත්‍ය ජලාශවල බාධක දැල් ස්ථාපනය කිරීම**

ග්‍රාමීය ප්‍රදේශවල ජනතාව වෙත පෝෂ්‍යදායී ආහාර වේලක් ලබා දීම සඳහා මිරිදිය හා ජලජීවී වගාව මඟින් විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහෙත්, රට අභ්‍යන්තරයේ ඇති ජලාශ පිටාර ගැලීමේදී මෙන්ම සොරොව් හරහා එම ජලාශවල ජලය මුදා හරින අවස්ථාවලදී මසුන් ඉවතට ගසාගෙන යෑම මිරිදිය මත්ස්‍ය අස්වැන්න විශාල වශයෙන් අඩු වීම කෙරෙහි දැඩි ලෙස බලපා ඇත. එක් මිරිදිය ජලාශයකින් වසරකට කිලෝග්‍රෑම් 20,000-40,000 අතර ප්‍රමාණයක මසුන් මෙසේ මිනිස් පරිභෝජනයට ගැනීමට පෙර ඉවත යන බව හඳුනාගනු ලැබ තිබේ. පරිණත වූ මසුන් ඉවතට ගසා ගෙන යාම, මත්ස්‍ය ගහණය අඩු වීම කෙරෙහි සහ අභිජනන හැකියාව ඇති පරිණත මසුන් ඉවත් වීමෙන් අනාගත මත්ස්‍ය තොගවල සීඝ්‍ර අඩු වීම කෙරෙහි බලපාන බව පෙන්වා දී ඇත. එබැවින්, මිරිදිය මත්ස්‍ය අස්වැන්න අහිමි වීම වැළැක්වීම සඳහාත්, මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නංවාගැනීම සඳහාත් වසර 02ක් තුළ තෝරා ගත් නිත්‍ය මිරිදිය ජලාශ 250ක බාධක දැල් ස්ථාපනය කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා ජාතික ජල ජීවී වගා සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කිරීම පිණිස ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් 'වියත්පුර' නිවාස ව්‍යාපෘතියෙන් නිවාස මිලදී ගැනීමේදී ලබා දී ඇති සහන ඉවත් කිරීම**

2022-05-09 දින රට තුළ ඇති වූ කලබලකාරී තත්ත්වය මත නිවාස අහිමි වූ එවක පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකරන ලද වියත්පුර නිවාස සංකීර්ණයෙන් නිවාස ඒකක 101ක් කුලී පදනම මත එක් වසරක කාලයක් සඳහා ලබා දීමට 2022-07-04 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත. ඉන් අනතුරුව, එම නිවාස සහනදායී ක්‍රමවේදයක් යටතේ මිල දී ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන ලෙස එම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ඉල්ලීම් ඉදිරිපත් කර තිබේ. ඒ අනුව, රුපියල් මිලියන 15.5ක අවම වටිනාකමකට සහ රුපියල් මිලියන 22ක උපරිම වටිනාකමකට සාමාන්‍ය ජනතාව

වෙත විකුණනු ලබන එම නිවාස ඒකකයක්, අවම වටිනාකම රුපියල් මිලියන 13.34ක් ලෙස සහ උපරිම වටිනාකම රුපියල් මිලියන 18.21ක් ලෙස අඩු කර සහනදායී ක්‍රමවේදය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ලබා දීමටත්, විකුණුම් මිලෙන් 25% මුදලක් පළමුව අය කරගෙන ඉතිරි මුදල වසර 15ක කාලයක් තුළ වාර්ෂිකව 10%ක පොළී අනුපාතයක් යටතේ ඔවුන්ගෙන් අය කර ගැනීමටත් 2024-07-15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. එම ක්‍රමවේදය යටතේ නිවාස මිල දී ගැනීම සඳහා හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 29දෙනෙකු 2024-12-31 දින වන විට විකුණුම් මිලෙන් 25%ක මුදලක් තැන්පත් කර තිබේ. එහෙත්, මෙම සහනදායී ක්‍රමවේදය හේතුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට රුපියල් මිලියන 92.126ක පමණ පාඩුවක් විඳීමට සිදු වී ඇති අතර, දරන ලද පිරිවැය ආවරණය කර ගැනීමට නොහැකි වී ඇත. එබැවින්, ඉහත පරිදි අනුමත කර ඇති සහනදායී ක්‍රමවේදය වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කිරීමටත්, අදාළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 29දෙනා එකඟ වන්නේ නම් සාමාන්‍ය මහජනතාවට එම නිවාස ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදය සහ එම මිල ගණන් යටතේ ඔවුන්ට ද නිවාස මිල දී ගැනීමට අවස්ථාව ලබා දීමටත් නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් සිදු කරන පැමිණිලි පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම**

2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතේ විධිවිධාන යටතේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවා ඇත. අතුරුදහන් වූ සහ දක්නට නොමැති තැනැත්තන් පිළිබඳව විමර්ශන සිදු කර ඔවුන්ගේ ඥාතීන්ට වාර්තා නිකුත් කිරීම සිදු කිරීම මෙම කාර්යාලය විසින් ඉටු කරනු ලබයි. මේ දක්වා එකී කාර්යාලය වෙත ලැබී ඇති 16,966ක් වූ පැමිණිලි අතරින් විමර්ශනය සඳහා තවදුරටත් පැමිණිලි 10,517ක් ඉතිරිව ඇත. ඒ අනුව, අගතියට පත් පාර්ශ්වයන්ට යුක්තිය ඉටු කිරීම සඳහා 2027 වර්ෂය අවසන් වන විට පරීක්ෂණ සහ අදාළ රාජකාරි නිම කිරීම පිණිස විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටත්, අදාළ කාර්යය සඳහා විශ්‍රාමික විනිසුරුවරුන්, ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරීන්, නීතිඥයින් ඇතුළු සුදුසුකම් සහිත පුද්ගලයින් 75දෙනෙකුගෙන් සමන්විත අනුමණ්ඩල 25ක් පත් කිරීමටත් අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **ජාතික කලාභවන වැඩිදියුණු කර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය කඩිනමින් නිම කිරීම**

ජාතික කලා භවන වැඩි දියුණු කර සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදු කරනු ලබන අතර ව්‍යාපෘතියේ සියලු කටයුතු 2024 වර්ෂය තුළදී ම අවසන් කිරීම පිණිස 2024-02-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. එහෙත්, එම කටයුතු පසුගිය වර්ෂයේ දී සම්පූර්ණයෙන්ම අවසන් කිරීමට නොහැකි වී ඇති අතර 2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු යටතේ ඒ සඳහා රුපියල් මිලියන 120ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ඇත. එහෙත්, ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන්ම අවසන් කිරීම සඳහා එම ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බවත්, තවදුරටත් රුපියල් මිලියන 32ක අමතර මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය බවත් මේ වන විට හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, ජාතික කලාභවන නවීකරණ කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා අමතර අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම සම්බන්ධයෙන් බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරයේ ප්‍රතිසංස්කරණ සහ නවීකරණ කටයුතු සිදු කිරීම**

ශ්‍රී ලංකා ග්‍රහලෝකාගාරය, 1965 වසරේදී පවත්වන ලද කාර්මික ප්‍රදර්ශනයේ ප්‍රධාන අංගයක් ලෙස ආචාර්ය ඒ.එන්.එස්.කුලසිංහ මහතා විසින් සැලසුම් කර නිර්මාණය කරනු ලැබ තිබේ. මේ වන විට එම ගොඩනැගිල්ලේ ව්‍යුහයෙහි දිරාපත් වීම් සහ භෞතික පහසුකම්හි හා තාක්ෂණික යටිතලයන්හි යල් පැන ගිය තත්ත්වයන් නිරීක්ෂණය වන බැවින්, සුවිශේෂී වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නොවෙනස්ව පවත්වා ගනිමින් එය නවීකරණය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති එකඟතාව මත පදනම්ව, පෙරසවි කොන්ක්‍රීට් තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුම ඇති ප්‍රමුඛතම රාජ්‍ය ආයතනයක් වන ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය (NERD) වෙත අදාළ කාර්යය පැවරීම පිණිස විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත සංශෝධනය කිරීම**

1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මඟින් ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය ස්ථාපනය කර ඇති අතර, එය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය ඇතුළු මෙරට ප්‍රමුඛතම උසස් අධ්‍යාපන ආයතන/විශ්වවිද්‍යාල සමඟ ශක්තිමත් හවුල්කාරිත්වයක් පවත්වාගෙන යමින් අලෙවිකරණ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම

සඳහා කටයුතු කරනු ලබයි. එම ආයතනය මඟින් වාර්ෂිකව අලෙවිකරණ හා ව්‍යවසායකත්ව වෘත්තීය සුදුසුකම් සහිත සිසුන් 8,000කට ආසන්න සංඛ්‍යාවකට අධ්‍යාපනය ලබා දෙන අතර, මෙරට ප්‍රමුඛ පෙළේ සමාගම් සිය සේවකයන්හට අලෙවිකරණ පුහුණුව ලබා දීම සඳහා එම ආයතනයේ සේවය ලබා ගනු ලබයි. එම ආයතනය මඟින් සපයනු ලබන සේවාවන් තවදුරටත් පුළුල් කිරීමට සහ වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි වන පරිදි 1980 අංක 41 දරන ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ විධිවිධාන සංශෝධනය කළ යුතු බව හඳුනාගෙන ඇත. ඒ අනුව, එකී පනත සංශෝධනය කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

13. **1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනත යටතේ වන වැරදිවලට අදාළ දඩ මුදල් සංශෝධනය කිරීම**

1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනත මඟින්, වයස අවුරුදු 16ට අඩු ළමයින් සේවයේ යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති අතර, එකී පනතේ විධිවිධාන පරිදි වයස අවුරුදු 16ට වැඩි එහෙත් 18ට අඩු තරුණ අය සේවයේ යෙදවීම සම්බන්ධයෙන් සේවා යෝජකයන් විසින් අනුගමනය කළයුතු රෙගුලාසි පනවනු ලැබ ඇත. අදාළ පනත හා එකී පනතේ විධිවිධාන පරිදි නිකුත් කරනු ලැබ ඇති රෙගුලාසි අනුව, අදාළ වයස් සීමාවේ ළමයින් හා තරුණ අය සෞඛ්‍යයට, ආරක්ෂාවට හා සදාචාරයට හානි වන ආකාරයේ අනතුරුදායක රැකියාවක යෙදවීම දඬුවම් ලැබිය හැකි වරදකි. එකී පනත සඳහා 2003 වර්ෂයේදී සිදු කරන ලද සංශෝධනය මඟින් එම පනතේ විධිවිධාන අනුව වරදකරු වන පුද්ගලයෙකුට රුපියල් 10,000/- නොඉක්මවන දඩ මුදලක් හෝ මාස 12ක් නොඉක්මවන කාලයක සිර දඬුවමක් යන දෙයාකාරයකින් එක් ආකාරයක දඬුවමක් හෝ එකී දඩය සහ සිර දඬුවම යන දෙකම සහ අධිකරණයේ අභිමතය පරිදි අගතියට පත් දරුවා වෙනුවෙන් වන්දි මුදලක් ද නියම කිරීම සඳහා විධිවිධාන හඳුන්වා දී ඇත. එහෙත්, අදාළ දඩ මුදල් වටිනාකම ප්‍රමාණවත් නොවන බවට නිරීක්ෂණය කර තිබේ. එබැවින්, ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 138 හා 182 සම්මුතීන් සමඟ අනුගත වෙමින් 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයෙහි යෙදවීම පනතේ 7(3), 13(2) හා 20(අ)(3) වගන්තිවල සඳහන් අවම දඩ මුදල් වටිනාකම යාවත්කාලීන කොට සංශෝධනය කිරීම පිණිස කම්කරු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**14. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත් කිරීම**

දැනට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ලෙස සේවය කරනු ලබන ඩී.ඩී.ජී.ඒ.සෙනෙවිරත්න මහත්මිය වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2025-09-05 දින සිට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමට නියමිතය. ඒ අනුව, පුරප්පාඩු වන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට දැනට එම දෙපාර්තමේන්තුවේ සේවය කරන ජ්‍යෙෂ්ඨතම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරිය වන කේ.එම්.ඩී.එස්.ඩී.කරුණාරත්න මහත්මිය එදින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**15. නිර්වාසික සැපයුම්කරුවන් විසින් ඉලෙක්ට්‍රොනික වේදිකා හරහා සේවා සැපයීම සඳහා එකතු කළ අගය මත බද්ද බලාත්මක කිරීමේ දිනය සංශෝධනය කිරීම**

2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් 2025-10-01 දින සිට බලපැවැත්වෙන පරිදි නිර්වාසික තැනැත්තෙකු (Non-resident) විසින් ඩිජිටල් සේවා සැපයීම එකතු කළ අගය මත බද්දට යටත් කර තිබේ. කෙසේ වුවද, ඩිජිටල් සේවාවන් සඳහා එකතු කළ අගය මත බද්ද අය කිරීමේ දී එයට අනුකූල වීම සඳහා සූදානම් වීමට අමතර කාලයක් ලබා දෙන ලෙස ප්‍රායෝගික හේතූන් කිහිපයක් දක්වමින් නිර්වාසික ඩිජිටල් සේවා සපයන්නන් විසින් ඉල්ලා ඇත. ඒ අනුව, 2025-10-01 දින වෙනුවට අදාළ බද්ද බලාත්මක කිරීමේ දිනය 2026-04-01 ලෙස සංශෝධනය කිරීමටත්, ඒ සඳහා අදාළ සංශෝධිත විධිවිධාන දැනටමත් කෙටුම්පත් කෙරෙමින් පවතින එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වන කෙටුම්පතට ඇතුළත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබා දෙන ලදී.

**16. අක්ෂි සවි කිරීම, කැඩුණු අස්ථි ස්ථායීකරණ සහ පෙළගැස්ම සහතික කිරීම සඳහා භාවිත කරනු ලබන උපකරණ කට්ටල සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය**

අස්ථි සවි කිරීම, කැඩුණු අස්ථි ස්ථායීකරණ සහ පෙළගැස්ම සහතික කිරීම සඳහා භාවිත කරනු ලබන උපකරණ කට්ටල සපයා ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු දෙකක් (02) ලැබී ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව, එකී උපකරණ කට්ටලවලින්

එස් ආර් අංක: 21209104 යටතේ අයිතම 24ක්, එස් ආර් අංක: 21209101 යටතේ අයිතම 30ක් සහ එස් ආර් අංක: 21209004 යටතේ අයිතම 20ක් මිල දී ගැනීම සඳහා වන ප්‍රසම්පාදනය ශ්‍රී ලංකාවේ Medisurg International (Pvt) Ltd. වෙත ඇමෙරිකානු ඩොලර් 435,000/-ක මුදලකට ප්‍රදානය කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**17. ටෙනෙක්ටිප්ලේස් එන්නත් මිලිග්‍රෑම් 40හි වයල් 30,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

හෘදයාබාධ ඇති වූ පුද්ගලයින් මිය යාම වළක්වා ගැනීම සඳහා ලබා දෙනු ලබන ටෙනෙක්ටිප්ලේස් එන්නතින් වයල් 30,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 03ක් ලැබී තිබේ. ඒ අනුව, ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව එකී ප්‍රසම්පාදනය සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ශ්‍රී ලංකාවේ ABC Pharma Services (Pvt) Ltd. (Manufacturer: Reliance Life Sciences (Pvt) Ltd., India) වෙත, මුළු පිරිවැය රුපියල් මිලියන 2,385ක මුදලකට පිරිනැමීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**18. හොලෝ ෆයිබර් ඩයලයිසර්, පොලිසල්ෆෝන්/පොලිඊතර්සල්ෆෝන්/ පොලිනෙෆ්‍රෝන්, අඩු ප්‍රවාහයේ සිට මධ්‍යම ප්‍රවාහය දක්වා $1.6m^2$-$1.8m^2$ න් 680,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

රුධිර කාන්දුකරණ ක්‍රියාවලිය සඳහා භාවිත කරනු ලබන හොලෝ ෆයිබර් ඩයලයිසර්, පොලිසල්ෆෝන්/පොලිඊතර්සල්ෆෝන්/පොලිනෙෆ්‍රෝන් යන ද්‍රව්‍ය ප්‍රසම්පාදනය සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා තිබේ. ඒ සඳහා ලංසු දෙකක් (02) ලැබී ඇත. ඒ අනුව, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුව නිර්දේශය මත පදනම්ව, එකී ප්‍රසම්පාදනය සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන චීනයේ Bain Medical Equipment (Guangzhou) Co. Ltd. වෙත මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 2.087ක මුදලකට ප්‍රදානය කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

19. **අන්තඃශෛරික භාවිතය සඳහා වූ හියුමන් ඉමියුනොග්ලොබියුලින් බීපී, ග්‍රෑම් 5-6 වයල් 120,000ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රතිශක්ති ඌනතා සහිත රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා යොදා ගනු ලබන අන්තඃශෛරික භාවිතය සඳහා වූ හියුමන් ඉමියුනොග්ලොබියුලින් බීපී, ග්‍රෑම් 5-6 වයල් 120,000ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසු 03ක් ලැබී තිබේ. එකී ලංසු සම්බන්ධයෙන් වන ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත පදනම්ව සාරානුකූලව ප්‍රතිචාරාත්මක අවම ලංසුකරු වන ඉන්දියාවේ Reliance Life Sciences (Pvt) Ltd. වෙත ඇමෙරිකානු ඩොලර් මිලියන 10.506ක මුදලකට ප්‍රදානය කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********